පසුගිය වසරේ ශ්‍රී ලංකාව තුළ සිදුවූ බවට පැවසෙන දිවි තොර කරගැනීම් සංඛ්‍යාව 3,074 ක් බව පොලිස් වාර්තාවන් හි දැක්වේ. එනම්, දිනකට දිවි තොර කරගැනීම් 8 කටත් වැඩි සාමාන්‍යයක් වාර්තාවී තිබේ. මෙම දිවි තොර කරගැනීම් සෑම එකකටම, දිවි තොරකරගැනීමට තැත් කිරීම් ගණනාවක්ද ගණන් තැබිය හැක.

දිවි තොර කරගැනීම් වාර්තා කිරීමේදී ආචාර ධාර්මික සහ ප්‍රවේසම් සහගත ප්‍රවේශයක් ගැනීමට මාධ්‍ය කටයුතු කළ යුතු වන්නේ, දිවි තොර කරගැනීම්ද වසංගතයක් ලෙසින් පැතිර යා හැකි නිසායි.

දිවි තොර කරගැනීම් වාර්තාකරණය පිළිබඳ මාධ්‍ය ආචාර ධර්මයන්හි දැක්වෙන ආකාරයට,

1) දිවි තොර කරගැනීමක් ප්‍රමුඛතාවයකින් යුතුව ඉදිරිපත් කිරීම තුළින්, අනුකාරක දිවි තොර කරගැනීම් සිදු විය හැක.

2) දිවි තොර කරගත් ආකාරය ඉදිරිපත් කිරීම තුළින්, එම ක්‍රමය අනුකරණය කරමින් සිදුවන අනුකාරක දිවි තොර කරගැනීම් සිදුවිය හැක.

3) දිවි තොර කරගත් අයෙකුගේ ඡායාරූප පෙන්වීම, දිවි තොර කරගැනීමේ නැඹුරුතාවයකට පත්විය හැකි අයෙකුට පසුකාලීනව හෝ දිවි තොර කරගැනීමකට නැඹුරු වීමට උත්ප්‍රේරකයක් විය හැක.

4) උපකාරක අංක සඳහන් නොකිරීම තුළින්, දිවි තොර කරගැනීමට නැඹුරුවක් ඇති අයෙකුගේ දිවි බේරාගැනීමට ඇති අවස්ථාවක් ගිලිහී යා හැක.

මේ අනුව, සිසුවෙකු දිවි තොර කර ගැනීමේ පුවත රූපවාහිනී පුවත් විකාශයන් සහ පුවත් වාර්තාවන් තුළ ඉදිරිපත් කෙරී ඇති ආකාරය සම්බන්ධයෙන් ඔබට සෑහීමකට පත් විය හැකිද?

හදිසි උපකාරක අංක:
*CCCline - 1333
* ශ්‍රී ලංකා සුමිත්‍රයෝ - 0112682535, 0112682570, 0112818860
*ජාතික මානසික සෞඛ්‍ය ආයතනය-1926 (දුරකථන ඇමතුම් හෝ කෙටි පණිවුඩ මාර්ගයෙන් සම්බන්ධ කරගත හැක)

මූලාශ්‍ර:
https://www.police.lk/.../04.Mode-of-suicides---for-Year...
https://media.samaritans.org/.../Media_Guidelines_FINAL.pdf
https://www.who.int/news-room/fact-sheets/detail/suicide

**#MediaEthicsSL #lka #sinhalanews #Divaina #Aruna #Mawbima #Lankadeepa #Derana #HiruTV #Swarnavahini**